දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 19/2014 (I)

මගේ අංකය :- ඩී/බ.කො.ජ/2014,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2014.06.03

සියළුම බන්ධනාගාර අධිකාරින් සහ
සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත,

<u>බන්ධනාගාර නිලධාරින් සඳහා දීමනා ලබා දීම</u>

උක්ත කරුණ සම්බන්ධව මගේ සමාංක හා 2014.05.29 දිනැති 19/2014 චක්‍රලේඛය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි. එහි සඳහන් දිරි දීමනා පහත පරිදි ගෙවීමට කටයුතු කරන ලෙස දන්වමි.

01. විදුලි දීමනාව :-

දැනටමත් ගෙවන අයුරින් ගෙවිය යුතුය.

02. රාත්‍රි සංචාර දීමනාව :-

I. ජේලර් තනතුරු සඳහා දැනටමත් ගෙවීමට අනුමැතිය දී ඇති අයුරින් ගෙවිය යුතුය.
II. සහකාර බන්ධනාගාර අධිකාරි තනතුර හා ඊට ඉහළ නිලධාරින් මසකට සංචාර 04 ක් කළ යුතු වේ.

03. සිරමැදිරි රාත්‍රි සංචාර දීමනාව :-

<u>හිමි නිලධාරින්</u>

මෙම දීමනාව හිමි වන්නේ ජේලර් සහ ඊට පහළ නිලධාරින් සඳහා පමණි.

- බන්ධනාගාර තුල සිරමැදිරි / වාට්ටු වල රාත්‍රී රාජකාරි කරන නිලධාරින්
- බන්ධනාගාර තුල රාත්‍රී රාජකාරි කරන කාර්යය භාර නිලධාරින්
- බන්ධනාගාර , එළිමහන් සිර කඳවුරු , වැඩ කඳවුරු වල රාත්‍රී සේවා භාර ජේලර් නිලධාරින්
- එළිමහන් සිර කඳවුරු , වැඩ කඳවුරු වල රාත්‍රී වාට්ටු භාර නිලධාරින්
- එළිමහන් සිර කඳවුරු , වැඩ කඳවුරු වල රාත්‍රී වාට්ටු භාර කාර්යය භාර නිලධාරින්
- බන්ධනාගාර සිර මැදිරිවල රැඳවියන්, රාත්‍රී කාලයේදී රඳවා තබන්නේ නම් පමණක් එම සිරමැදිරිවල රාත්‍රී රාජකාරි කරන නිලධාරින් සඳහා එම දිනයන් වෙනුවෙන්
- මුර අට්ටාල , අවිභාර නිලධාරින් සහ දොරටු රාජකාරි කරන නිලධාරින් (රාත්‍රී සේවය කරන)

04. ආරක්ෂණ රාජකාරි දීමනා :-

අධිකරණ රාජකාරි කටයුතු ඉටුකරනු ලබන නිලධාරින් සඳහා පමණි.

05. යහපත් කල්ක්‍රියා දීමනාව :-

තනතුරේ ස්ථිර කර ඇති සැරයන් සහ ඊට පහළ නිලයන් සඳහා පමණි.

ඉහත දීමනාව පහත සඳහන් කොන්දේසි වලට යටත් වන්නේය.

- ආයතන සංග්‍රහයේ 11 වන කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 1 වන උපලේඛය යටතේ විෂමාචාරයකට වැරදිකරු වී දඬුවම් ලබා ඇත්නම්, එකී වරද සිදු කළ දින සිට වසර 04 ක් ගතවන තුරු ඉහත දීමනාව ලබා ගත නොහැක.
- ආයතන සංග්‍රහයේ 11 වන කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 11 වන උපලේඛය යටතේ විෂමාචාරයක් සම්බන්ධයෙන් වැරදිකරු වී දඬුවම් ලබා ඇත්නම්, එකී වරද සිදු කළ දින සිට වසර 02 ක් ගතවනතුරු ඉහත දීමනාව ලබා ගත නොහැක.
- රාජකාරියේදී සිදු වූ කිසියම් සුළු වරදකට අවවාද හෝ තරයේ අවවාද ලබා ඇති අවස්ථාවකදී එකී වරද සිදු වූ දින සිට වසරක් ගත වනතුරු ඉහත දීමනාව ලබා ගත නොහැක.

06. අවදානම් දීමනාව :-

ආරක්ෂණ රාජකාරි කටයුතු වල යෙදෙන හා සෘජුවම බන්ධනාගාරවල රාජකාරි කරනු ලබන නිලධාරින් සඳහා පමණි.

07. සෞඛ්‍ය ආරක්ෂික දීමනාව :-

ජේලර් ශ්‍රේණිය හා ඊට පහළ සියළුම නිලයන් සඳහා

08. ගමන් වියදම් දීමනාව :-

උසාවි ආරක්ෂණ හා රෝහල්වල සිරකරුවන් රැගෙන යන නිලධාරින් සඳහා (දැනට සංයුක්ත දීමනාව හිමි නොවන)
මෙම දිමනාව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006(IV) හි සඳහන් පරිදි ගෙවිය යුතුය. (උපරිම දින 20 යි)

ඉහත අංක 02 සිට 08 දක්වා දීමනා ලබා ගැනීමට මසකට අවම වශයෙන් දින 21 ක් සේවය කළ යුතු අතර, වැටුප් රහිත හෝ අඩවැටුප් නිවාඩු ලබා ගෙන ඇති මාස සඳහා දීමනා හිමි නොවේ. මෙම විධිවිධාන 2014.04.01 දින සිට ක්‍රියාත්මක වේ.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත :- කොමසාරිස් (මුදල්)